# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1592 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 19/12/2023<br>පැය 0620 |

## මාධ්‍ය නිවේදනය

**හදිසි අනතුරක් හේතුවෙන් ප්‍රතිකාර ලබමින් සිටි පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරියෙකු මියයාම - පොලිස් විශේෂ කාර්ය බලකාය.**

2023.10.11 වන දින ඉමදුව ප්‍රදේශයට පැවති අධික වර්ෂාවත් සමඟ ඉමදූව පොලිස් වසමේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ 101.4 ආර් කණුව අසල පස් කන්දක් නායයෑමකට ලක්ව තිබිණි. එම ආපදා ස්ථානය වෙත පැමිණි පොලිස් නිලධාරීන් හා පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් ආපදා ස්ථානයේ රථවාහන අනතුරට ලක්වී ඇත්ද පරික්ෂා කර බලමින් සිටියෙදී එම ස්ථානයේම තවත් නායයෑමක් සිදුවීම හේතුවෙන් එහි රාජකාරි යෙදී සිටි පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරියෙකු බරපතල තුවාල ලබා කරාපිටිය රෝහලට ඇතුලත්කර දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2023.12.18 වන දින මියගොස් ඇත.

**නිලධාරියා වයස අවුරුදු 42 ක් වූ වලව්වත්ත පාර, කළුතර ප්‍රදේශයේ පදිංචි පෙලිස් විශේෂ කාර්ය බලකා දක්ෂිණ අධිවේගී මර්ගයේ පින්නදූව උප ඒකකයට අනුයුක්තව රාජකාරි කල පොලිස් සැරයන් 38747 වඩුගේ දමිත් නිශාන්ත ප්‍රනාන්දු යන අය වේ.**

නිලධාරියාගේ මෘත දේහය විජයගිරි පලවින්න, නාකුළුගමුව ලිපිනයේ තැන්පත් කර ඇති අතර අවසන් කටයුතු 2023.12.20 දින සිදු කිරීමට නියමිතව ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**